# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/209 /2025 (PSC)

01. එස්.කේ.කරුණාතුංග,
02. ඩබ්.ඒ.එස්.සී.පී.ජාන්ස,
03. එල්.පී.එම්.ප්‍රියදර්ශනී,
04. එස්.පී.අතුකෝරල,
05. එම්.එම්.එම්.ජේ.මංචනායක,
06. ආර්.එච්.ඩී. චමිල කුමාර,
07. කේ.ඉලන්තුමුතන්,
08. ආර්.පී.එන්.උදානි,
09. ඩබ්.කේ.එන්.නයෝමි,
10. එම්.එම්.නිලන්ති කුමාරි,
11. එම්.ඒ.සී.අහමඩ් නසීල්,
12. ටී.ජේකොබ් අතිෂයරාජ්,
13. එම්.සුලෝචනා,
14. පී.එම්.ඩබ්.එස්.ගුණවර්ධන,
15. අයි.සී.ජේ.ගුනරත්න,
16. ආර්.පී.එස්.නිශාන්ත,
17. එම්.සී.පී.එස්.කුමාර,
18. එස්.එස්.ඉවැංජලින්,
19. එස්.යෝකරාජ්,
20. කේ.පී.එන්.එස්.විජේතුංග,
21. එස්.එම්.ආර්.එන්.දමයන්ති,
22. ඩබ්.ඒ.එස්.ජයවර්ධන,
23. සී.වික්‍රමසිංහ,
24. ඩබ්.ඒ.ජනහිත,
25. කේ.ඩී.වයි.බිමාලි,
26. ඩබ්.ඒ.එස්.වාසලමුණි,
27. ර්.එම්.චන්ද්‍රකාන්ති.

**අභියාචකවරුන්**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.02.19**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචකයින් වෙනුවෙන් නීතිඥ ඩබ්.ඒ.ජයවික්‍රම මහතා. වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම්.පී.එම්.මධූෂා මිය.

**-නියෝගය-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

එස්.කේ.කරුණාතුංග ඇතුළු තවත් අභියාචකයින් 26 දෙනෙකු විසින් (ඒ අනුව මෙම අභියාචනයට අදාළව අභියාචකයින් 27 දෙනෙකු සිටී) 2025.08.25 දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇති එකම ඉල්ලීම වන්නේ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට අයත් ඔවුන් වෙත, 2014.06.02 දින සිට බලාත්මක වන පරිදි ලබා දෙන ලද පත්වීම්, 2013.12.28 දින සිට ක්‍රියාත්මක වන ලෙස පෙරදාතම් කර දෙන ලෙසයි.

ඉහත ඉල්ලීම සඳහා අභියාචකයින් විසින් පදනම් කර ගෙන ඇත්තේ, ඔවුන් හා සමඟ එකම ලිඛිත විභාගයට සහභාගී වූ සහ එකම දිනයක පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයකින් පසු බඳවා ගෙන ඇති වෙනත් නිලධාරීන් 37 දෙනෙකුගේ පත්වීම්, ඉහත කී 2013.12.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී තිබීමයි.

ඉහත කණ්ඩායම් දෙක සඳහා පැවැති ලිඛිත පරීක්ෂණය, 2012.07.21 සහ 2012.07.22 යන දිනයන්හි පැවැත්වූ බව විවාදයෙන් තොරව පිළිගෙන ඇත. ඒ සමගම එම ලිඛිත පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව 2013.12.28 දින පවත්වන ලද වාචික සම්මුඛ පරීක්ෂණයටද කණ්ඩායම් දෙකම සහභාගී වූ බවද දෙපාර්ශවය විසින්ම පිළිගෙන ඇත.

මෙම තත්ත්වය යටතේ අභියාචකයින් විසින් කරුණු ඉදිරිපත් කරමින් පවසා සිටියේ, එකම අවස්ථාවන්හිදී පවත්වන ලද පරීක්ෂණ වලින් අනතුරුව, කණ්ඩායම් දෙකකට, වෙන් වෙන් දින දෙකක සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබාදෙමින්, අභියාචකයින්ට වෙනස් ආකාරයට සළකමින් ක්‍රියා කර ඇති බවයි.

ඒ අන්දමට ක්‍රියා කරමින් පත්වීම් ලබාදීම නිත්‍යානුකූල නොවන බවට වැඩිදුරටත් කරුණු දක්වන ලදි.

ඉහත ආකාරයට දිනයන් දෙකක් අදාළ කර ගනිමින් පත්වීම් දීමට හේතු මොනවාදැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරුණු ඉදිරිපත් කරමින්, ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පදනම් කරගෙන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටි සහකාර ලේකම්, එම්.පී.එච්.මධූෂා යන අය වැඩිදුරටත් වාචිකව ද කරුණු ඉදිරිපත් කරන ලදි. එකී කරුණු කෙරෙහි ද අපගේ අවධානය යොමු විය. එම වාර්තාවේ 15 වන ජේදයේ, එම කරුණු සවිස්තරාත්මකව දක්වා ඇත. එහි සඳහන් කර ඇත්තේ, අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන ලද්දේ අවස්ථා දෙකකදී බවයි. ඒ සමගම පුරප්පාඩු ගණනය කර ඇත්තේ ද ඉහත සඳහන් පරිදි දිනයන් දෙකක් අදාළ කරගෙන බවට එහි වැඩිදුරටත් සඳහන් වේ. ප්‍රථම කණ්ඩායම 2010 කණ්ඩායම ලෙසත්, දෙවෙනි කණ්ඩායම 2011 කණ්ඩායම ලෙසත් වෙන් වෙන්ව හඳුනාගෙන ඇති බවත්, බඳවා ගැනීම සඳහා කරන ලද දැනුම්දීම අවස්ථා දෙකකදී ප්‍රකාශයට පත්කරන ලද බවත් ය. තවද, ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන ලද්දේ ඉහත කී අවස්ථා දෙක පදනම් කරගෙන බවත් එහි සඳහන් වේ.

ඉහත අන්දමට අවස්ථා දෙකකදී කරන ලද දැනුම් දීම් මත කණ්ඩායම් දෙකක් වශයෙන් අයදුම්කරුවන් හඳුනාගෙන ඇතත්, කණ්ඩායම් දෙක සඳහාම එකම අවස්ථාවක ලිඛිත පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත. කරුණු එසේ තිබියදී, පරීක්ෂණය පැවැත්වීමට ප්‍රථම හෝ ඉන්පසුව ගෙන ඇති ක්‍රියා මාර්ග කුමන ආකාරයට ගෙන තිබුනේ වුවත්, ඒ මතම ඉහත කී කණ්ඩායම් දෙක වෙන් වෙන් කණ්ඩායම් ලෙස සැලකීම නිවැරදි ක්‍රියා මාර්ගයක් වන්නේ නැත.

මේ අවස්ථාවේ දී ඉහත කී රාජ්‍ය සේවා කොමිෂන් සභා වාර්තාවේ 20 වන ජේදයේ සඳහන් කරුණු වලට අපගේ විශේෂ අවධානය යොමු කරන ලදි. එහි සඳහන් වන්නේ, අභියාචකවරුන් විසින් ඉල්ලා ඇති පරිදි ඔවුන්ගේ පත්වීම් පෙරදාතම් කළහොත් වෙනත් නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට එය බාධාවක් විය හැකි බවයි. දැනටමත් වාචික පරීක්ෂණ පැවැත්වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇති කණ්ඩායමට පහළින් අභියාචකයින්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරමින් නියෝගයක් කළහොත්, එම කණ්ඩායම් දෙක අතර, ජ්‍යෙෂ්ඨත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නගින්නේ නැත.

කෙසේ වෙතත් ඉහත කී වාර්තාවේ 20 වන ජේදයේ B සහ C වශයෙන් සඳහන් කර ඇති, විශේෂ ගණයේ සළකා ඇති නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සම්බන්ධයෙන් වන කරුණු කෙරෙහිද අවධානය යොමු කරන ලදි. එයින් B

ඡේදයේ සඳහන් වන්නේ, නිලධාරීන් දෙදෙනෙකුගේ ජ්‍යෝෂ්ඨත්වයට එයින් හානියක් විය හැකි බවයි. ඔවුන් දෙදෙනා ඇතුළත් වන්නේ ඉහත කී පළමු කණ්ඩායමටයි. මේ අවස්ථාවේ දී ඔවුන් දෙදෙනාට පත්වීම් ලබා දී නොමැති අතර, ඔවුන් දෙදෙනාගේ ජ්‍යෝෂ්ඨත්වය පහළට පැමිණ ඇත්තේ, ඔවුන් දෙදෙනා සම්බන්ධයෙන් වන වෙනත් විශේෂ බාහිර කරුණු හේතුවෙනි. එම තත්ත්වය යටතේ මෙම අභියාචකයන්ට පත්වීම්, ඔවුන් විසින් ඉල්ලා ඇති පරිදි ලබාදීමෙන්, වෙනත් හේතූන් මත උසස් වීම් ලබා නොදී ඇති එම දෙදෙනාගේ ජ්‍යෝෂ්ඨත්වයට එය අදාළ කරගත නොහැක. එම ඡේදයේ “C” ලෙස තවත් නිලධාරීන් 10 දෙනෙකුගේ ජ්‍යෝෂ්ඨතාවයට හානි විය හැකි බවට කරුණු ඉදිරිපත් කර ඇත. එම නිලධාරීන් 10 දෙනාට පත්වීම් ලබා දී ඇත්තේ, මීට ඉහත කාල පරිච්ඡේදයන් තුළදීය. එසේ ඔවුන්ට පත්වීම් ලබාදී ඇත්තේ 2006, 2009, 2010 වැනි විවිධ වූ වර්ෂ වලදී වැනි, ඉතාමත් දීර්ඝ කාලයකට පෙර දිනයන් හී දීය. ඒ අනුව ඔවුන්ගේ ජ්‍යෝෂ්ඨත්වය දැනටමත් ලැබී නොමැත්තේ, ඔවුන්ටම ආවේනික වූ විවිධ හේතූන් නිසාය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ ඉහත හේතු සළකා බලා, අභියාචකයින් විසින් ඉල්ලා ඇති සහන ලබා දීමෙන්, එකී වාර්තාවේ 20 වන ඡේදයේ සඳහන් අනික් නිලධාරීන්ගේ ජ්‍යෝෂ්ඨත්වයට එමගින් හානියක් වන බවක් පෙනී යන්නේ නැත.

මේ අවස්ථාවේ දී මෙම විනිශ්චය අධිකාරය විශේෂ අවධානය, මෙම අධිකාරය විසින්ම ලබා දී ඇති 2022.08.03 දිනැති, AAT/98/2019(PSC) දරණ අභියාචනයෙහි ලබාදී ඇති නියෝගය කෙරෙහි යොමු වන අතර, එහි පැහැදිලිවම සඳහන් කර ඇත්තේ, පත්වීම් සම්බන්ධයෙන් පවත්වන ලද ලිඛිත පරීක්ෂණය හෝ වාචික පරීක්ෂණය පදනම් කරගෙන පත්වීම් ලබා දිය යුතු බවයි. එම තීරණය අනුව ක්‍රියා කිරීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වමු. ඒ අනුව එම තීන්දුවට ද ඉහතින් සඳහන් අනෙකුත් කරුණු වලටද අවධානය යොමු කරමින්, පහත සඳහන් නියෝගය ප්‍රකාශයට පත් කිරීමට තීරණය කරමු.

අභියාචකයින් සියළු දෙනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට කරන ලද පත්වීම 2013.12.28 දින සිට (එනම් සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දින සිට) ක්‍රියාත්මක විය යුතු බවට නියෝග කරමු.

ඒ අනුව අභියාචකයින්ට දැනටමත් ලබා දී ඇති තනතුර, 2013.12.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙරදාතම් කිරීමට තවදුරටත් තීරණය කර නියෝග කරමු. මෙම තීරණය හේතුවෙන් අභියාචකයන්ට කිසිදු හිඟ වැටුප් හෝ වෙනත් දීමනා කිසිවක් හිමි නොවිය යුතුය.

තවද, මෙම අභියාචකයන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීමේ දී දැනටමත් 2013.12.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ට වඩා පහළින්, ජ්‍යෙෂ්ඨත්ව ලේඛනයේ තැබිය යුතු බවට තවදුරටත් නියෝග කරමු.

මේ සම්බන්ධයෙන් වන සැකයන් දුරු කිරීම සඳහා මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු වන්නේ, අභියාචකයින් හෝ ඔවුන් අයත් නොවන අනික් කණ්ඩායමේ නිලධාරීන් ඉදිරි කාල පරිච්ඡේදය තුළ වෙනත් උසස්වීම් හෝ වෙනත් කිසිදු ආකාරයක ඉල්ලීමක් සිදුකරන අවස්ථාවක දී, එම කරුණ සඳහා අවශ්‍ය කරන සුදුසුකම් මත, හා ඒ අවස්ථාවේ පවතින සේවා ව්‍යවස්ථාව අනුව, බඳවා ගැනීමේ කාර්ය පටිපාටියේ විධිවිධාන හා සුදුසුකම් මත ඒ සම්බන්ධයෙන් තීරණයන් ගත හැකි වන බවට ද වැඩිදුරටත් තීරණය කරමු.

ඉහත කොන්දේසි මත අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

අභියාචනයට ඉඩදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-